# පරීක්ෂක වාර්තාව

අන්තර්මධ්‍ය විභාගය - ජනවාරි 2014

(56) ව්‍යාපාර නීතිය හා කළමනාකරණය

විෂයයේ

**ව්‍යාපාර නීතිය**

(Business Law)

---

ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 6 ක් දක්වා තිබූ අතර පිළිතුරු බලාපොරොත්තු වී තිබුණේ ඉන් 5 කට පමණි.

## ප්‍රශ්න අංක 01 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) මෙම කොටසින් ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය යටතට ගැනෙන නීති දෙකක් බලාපොරොත්තු විය. බහුතරයක් අයදුම්කරුවන් මෙම කෙටි ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් එයට සිවිල් නීතිය හා අපරාධ නීතිය යනුවෙන් පිළිතුරු ලියූ අවස්ථා තිබුණි.

(b) මහාධිකරණයක් විසින් වැරදිකරුවෙකුට පැනවිය හැකි දඬුවම් පිළිබඳ විමසීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිතය. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු ලිවීමට සමත්වී තිබුණි.

(c) මෙම කොටසට පිළිතුරු සැපයීමේදී අයදුම්කරුවන්ට ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබූ බව පැහැදිලි වුවද එම රිට් ආඥාවල නම් ලිවීමේදී නිවැරදිව ලිවීමට අපොහොසත් වී තිබුණි.

(d) මෙම කොටසට පිළිතුරු සැපයීමේදී අයදුම්කරුවන් ප්‍රධානියා සහ නියෝජිතයා අතර සබඳතාවය හට ගන්නා ලේඛන වෙනුවට නියෝජ්‍යත්වය හට ගන්නා ක්‍රම සඳහන් කර තිබුණි.

(e) මෙම කොටසට නිවැරදි පිළිතුරු සැපයීමට බොහෝ අයදුම්කරුවන් අසමත් වී තිබුණි.

## ප්‍රශ්න අංක 02 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය නියෝජ්‍යත්ව නීතිය පදනම් කරගෙන අසා ඇති අතර, එහි (a) කොටසට සාර්ථක පිළිතුරු සපයා තිබුණත් (b) කොටසට සාර්ථක පිළිතුරු සපයා නොතිබුණි. එසේම සමහර අයදුම්කරුවන් නියෝජ්‍යත්ව නීතිය පිළිබඳව අනවබෝධයෙන් පිළිතුරු සපයා ඇති බව පෙනුණි.

## ප්‍රශ්න අංක 03 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

"වරදවා දැක්වීම / අවනිදේශනය" (misrepresentation) යන පදය ගිවිසුම් නීතිය ඇසුරින් නිර්වචනය කර වරදවා දැක්වීම / අවනිදේශන වර්ග දෙකක් පැහැදිලි කිරීමට තිබුණි. එහෙත් බොහෝ අයදුම්කරුවන් සාර්ථක පිළිතුරු සපයා නොතිබුණි. මෙම ප්‍රශ්නයට බොහෝ දෙනෙකු ගිවිසුමක් අසාර්ථක වන කරුණු දක්වා තිබුණි. අයදුම්කරුවන් සුළු පිරිසක් පමණක් ඉතාමත් අවබෝධයෙන් යුතුව නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

## ප්‍රශ්න අංක 04 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

"ගිවිසුමක් ව්‍යර්ථ වීමකදී (frustration of a contract) පාර්ශවකරුවන් විසින් ඉටු කළ යුතු ගිවිසුම්මය බැඳීම් වලින් ඔවුන් නිදහස් වේ". ගිවිසුම් නීතිය ඇසුරින් පිළිතුරු ලිවීම අපේක්ෂිත විය. බොහෝ අයදුම්කරුවන් සාර්ථක පිළිතුරු සපයා තිබුණි. සුළු පිරිසක් ගිවිසුමක් අසාර්ථක වන කරුණු දක්වා තිබිණි.

## ප්‍රශ්න අංක 05 - ලකුණු 10
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ සේවා යෝජකගේ වගකීම සාකච්ඡා කිරීම ප්‍රශ්නයෙන් අසා තිබුණි. ආයතනයක සේවක සංඛ්‍යාව 15 ක් හෝ ඊට වැඩිවීම හා සේවකයාගේ සේවා කාලය අවුරුදු 5 ක් වීම අපේක්ෂිත පිළිතුර විය. බොහෝ අයදුම්කරුවන් පිළිතුර නිවැරදිව දක්වා තිබුණද සමහරු ඒ පිළිබඳව දැනුවත් වී නැති බව පෙනුණි.

**(b)** සේවක අර්ථසාධක අරමුදලේ දායකය, සෙවකයෙකුට ලබාගැනීමට හැකිවන අවස්ථාවන් තුනක් පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණි. මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුර ලියා තිබුණි.

## ප්‍රශ්න අංක 06 - ලකුණු 10
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** විකුණුම්කරුවෙකු විසින් භාණ්ඩ විකිණීමේ ගිවිසුම කඩකර ඇති විටෙක ගැනුම්කරුවෙකුට හිමි ප්‍රතිකර්ම භාණ්ඩ විකිණීමේ ආඥා පනතට අනුව කෙටියෙන් පැහැදිලි කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිතය. කෙසේවෙතත් මේ සඳහා නිවැරදි පිළිතුරු සපයා නිවැරදිව පැහැදිලි කිරීමට බහුතරයක් අසමත් විය. මෙයට ප්‍රධාන හේතුව විය හැක්කේ පැහැදිලි කිරීම් වලින් තොරව එක් කරුණක් පමණක් දක්වා තිබීමය. ඇතැම් අයදුම්කරුවන් භාණ්ඩ විකිණීමේ ආඥා පනත පිළිබඳව සැලකිලිමත් නොවී සාමාන්‍ය දැනුමෙන් අදාල නොවන පිළිතුරු ලියා තිබුණි.

**(b)** වෙක්පතක යොදනු ලබන රේඛන වර්ග පිළිබඳව අසා තිබූ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් වැඩි දෙනෙකු නිවැරදි පිළිතුරු සැපයීමට සමත් විය.

### <u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීම සඳහා සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>

1. ප්‍රශ්න පත්‍රය ලබා ගත් වහාම ආරම්භයේ දී ඇති උපදෙස් හොඳින් සැලකිලිමත්ව කියවා තෝරා ගතහැකි ප්‍රශ්න මොනවාද යන්න පිළිබඳව අවබෝධ කර ගත යුතුය.
2. ප්‍රශ්නය කීපවරක් හොඳින් කියවා මැනැවින් අවබෝධ කර ගෙන අසා ඇති කරුණු වලට පමණක් පිළිතුරු සැපයිය යුතුය. අදාල නොවන කරුණු ඇතුලත් නොකළ යුතුය.
3. පිළිතුරු සැපයීමේදී කාලය බෙදාගැනීම පිළිබඳව සැලකිලිමත් විය යුතුය.
4. උත්තර පත්‍ර භාර දීමට පෙර විභාග ශාලාවේදී ප්‍රශ්න අංක හා තමන්ගේ විභාග අංකය නිසිපරිදි යොදා ඇත්දැයි පරීක්ෂා කර බැලීම.
5. අත්අකුරු පැහැදිලිව ලිවීම මගින් පරීක්ෂකවරයාට උත්තර පත්‍රය කියවා හොඳින් අවබෝධ කරගැනීමට සැලැස්වීමෙන් උපරිම ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට හැකිවනු ඇත.
6. විභාගයට පෙර පසුගිය ප්‍රශ්න පත්‍රවලට නිශ්චිත කාලයක් තුල පිළිතුරු සපයා පෙර පුහුණුවක් ලබාගැනීමෙන් විෂය දැනුම වර්ධනය කර ගැනීමටත්, වේගවත්ව පිළිතුරු සැපයීමේ නිපුණතාව ඇතිකර ගැනීමටත් හැකියාව ලැබේ.
7. දැනුම යාවත්කාලීන කර ගැනීම සඳහා අළුතින් නිකුත් කරන සඟරා, පුවත්පත්, අත්පොත්, පාඨ ග්‍රන්ථ නිරන්තරයෙන් අධ්‍යයනය කළ යුතු වේ.
8. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -